**නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2022**
**-----------------------------------------------------------------------------------------**

නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය අතර 2017 ජුලි 07 දින එළඹි අංක එස්එල්-පී 116 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4 ඡේදයේ 6 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 04 ක පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් මිනිසුන්ගේ ජීවන තත්ත්වයන් ඉහල නැංවීම හා ජීවනෝපාය සංවර්ධනය කිරීම වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 20,622 කට සමාන ජපන් යෙන් මිලියන 15,409 ක් වන අතර ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් රු.මිලියන 17,185කට සමාන ජපන් යෙන් මිලියන 12,957 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,437කට සමාන ජපන් යෙන් මිලියන 2,452ක් මූල්‍යයනය කිරීමට ශ්‍රී ලංකා රජය එකග වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජුලි 07 දින ආරම්භ කර තිබුණු අතර 2024 ජුලි 07 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

**1.3 මතය**

ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

#### 2.1.1 සැලසුම්කරණ සහ අධීක්ෂණ උපදේශකවරුන්ගේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | JICA ආයතනය විසින් 2022 අප්‍රේල් මාසයේදී අරමුදල් සැපයීම නතර කර තිබූ අතර ඒ වන විට පානීය ජල උප ව්‍යාපෘති 11 ක උපදේශන වාර්තාව සහ ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග ව්‍යාපෘති 95 න් 77 ක් අවසන් කර නොතිබූ බැවින් උපදේශක සමාගම අපේක්ෂිත කාර්ය සාධනය ලබා ගෙන නොතිබුණි. | පානීය ජල ව්‍යාපෘති සඳහා වන සියලුම උප ව්‍යාපෘතිවලට අදාළ ලේඛන 2021.04.30 ට පෙර උපදේශන සමාගම විසින් සම්පූර්ණයෙන්ම ලබා දී තිබුණි. ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග උප ව්‍යාපෘතිවල අවසන් අදියරේ දී ලබා දිය යුතු උප ව්‍යාපෘති 80න් 51ක් සඳහා ඇස්තමේන්තු 2022.04.30 වන විට ලබා දී ඇති අතර ඉතිරි උප ව්‍යාපෘති 27 සඳහා ඇස්තමේන්තු 2022 සැප්තැම්බර් 22 වන විට ලබා දී ඇත. පළාත් කාර්යාලවල විදුලිය ඇනහිටීම හේතුවෙන් ඔටෝ කැඩ් සැලසුම් නිර්මාණය කිරීම ප්‍රමාද විය. | උපදේශන කටයුතු සහ ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පානීය ජල උප ව්‍යාපෘති සඳහා උපදේශක සමාගම එකඟ වූ උප ව්‍යාපෘති **73** න් **39** ක් අතහැර දමා තිබුණි. ඒ අනුව, එම සමාගමට ගෙවිය යුතු මුදල සහ විස්තරාත්මක සැලසුම්, ශක්‍යතා අධ්‍යයනය සහ ප්‍රසම්පාදන ලේඛන ඇතුළු සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීමට ලබා දී ඇති කාලය යන දෙකම අඩු කළ යුතුය. කෙසේ වෙතත්, උපදේශක සමාගම පිරිවැය සහ මිනිස් මාස අඩු කිරීම සඳහා එවැනි වැඩසටහනකට එකඟ වී ඇති බව විගණනයට තහවුරු නොවීය. | පානීය ජල ව්‍යාපෘති සඳහා තෝරාගත් ව්‍යාපෘති ප්‍රමාණය **34**ක් වුවද පානීය ජල සම්බන්ධතා ලබා දිය යුතු ග්‍රාහක සංඛ්‍යාව ව්‍යාපෘති මුල් සැලැස්මට අනුව **120846**කි. එම ප්‍රමාණය අඩු වී ඇත්තේ ග්‍රාහකයින් **89204** කටය. එය මුල් සැලැස්මෙන් **26.18%**ක අඩු වීමකි.එම අඩුවූ වැඩ ප්‍රමාණය වෙනුවෙන් නව සැලසුමකට අනුව කාර්යමණ්ඩලය යෙදවීම පිණිස **2022** ජනවාරි මස සිට සාකච්ඡා වට ගණනක් පැවති අතර අවසානයේදී එකග වූ සැලැස්ම **2022** මාර්තු **01** සිට ක්‍රියාත්මක කිරීමට දෙපාර්ශවය එකග විය. **JICA** ආයතනය විසින් තාවකාලිකව මූල්‍යාධාර සැපයීම නවතා දැමීම නිසා ඇති වූ තත්ත්වය සැලකිල්ලට ගෙන **2022** අගෝස්තු **15** දින සිට බලපැවැත්වෙන පරිදි කාර්යමණ්ඩලයේ වැඩ කරන දින ගණන් අඩුකර සේවයේ යොදවා ඇත. | අත්හරින ලද උප ව්‍යාපෘති සංඛ්‍යාවට අනුලෝමව උපදේශක සමාගමට ගෙවිය යුතු මුදල අඩු විය යුතුය. |
| (ඇ) | **JICA** ආයතනය අරමුදල් ලබාදීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් **2022** දෙසැම්බර් **31** වන විට අපේක්ෂිත භෞතික ප්‍රගතිය ලබා ගැනීමට අපොහොසත් වූ උප කොන්ත්‍රාත් **62** ක් අතරින්, මන්දගාමී ඉදිකිරීම් හේතුවෙන් උප කොන්ත්‍රාත්තු **24** ක ප්‍රගතිය සියයට **1-68** අතර වූ අතර උප කොන්ත්‍රාත්තු **38** ක ප්‍රගතිය සියයට **0-95** අතර විය. | **JICA** ආයතනය විසින් අරමුදල් ලබාදීම තාවකාලිකව අත්හිටුවා ඇත. ඉදිකිරීම් ප්‍රගතිය මන්දගාමීව පවතී | වැඩ සැලැස්මට අනුව එය අවසන් කළ යුතුය. |

**2.2** මතභේදයට තුඩුදෙන කරුණු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග උපදේශක සමාගම සහ ලේකම්වරයා අතර අත්සන් තබන ලද ගිවිසුමේ ඇතුළත් වැඩ විෂය පථය විස්තර කරන උපග්‍රන්ථ **A** හි ක්‍රියාකාරකම් **3** හි **“**කාර්යය **1.2** විසින් සමාලෝචනය කරන ලද **PPS** සහ සේවා යෝජකයාගේ අවශ්‍යතා මත පදනම්ව, උපදේශකයා විසින් මිනුම් කිරීම, නිර්මාණ සැකසීම, ප්‍රමාණ සහ පිරිවැය ඇස්තමේන්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ කාලසටහන ද ඇතුළුව ක්ෂේත්‍ර මිනුම් මත පදනම්ව සවිස්තරාත්මක සැලසුම් සකස් කළ යුතුය.**”** යනුවෙන් සඳහන් කර ඇත. කෙසේ වෙතත්, | එවැනි විමර්ශනයක් සහ දත්ත රැස්කිරීමක් සිවිල් වැඩ කොන්ත්‍රාත්තුවට ඇතුළත් කිරීමට යෝජිතව තිබූ බැවින් උපදේශකවරයා, මාර්ග සැලසුම් සඳහා වන කිසිදු විමර්ශනයක පිරිවැය ඔවුන්ගේ මූල්‍ය යෝජනාවට ඇතුළත් කර නොතිබුණි. | එකඟ වූ කාර්යය උපදේශකවරයා විසින් සිදු කළ යුතු අතර කොන්ත්‍රාත්කරුට ඒ සඳහා මුදල් නොගෙවිය යුතුය. විගණනයට නිවැරදි පිළිතුර ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත් පැකේජ 37ක් සඳහා සැලසුම් සැකසීම,හරස්කඩ මිනුම් ගැනීම සහ නිර්මාණ ඇඳීම සඳහා රුපියල් මිලියන 31.4ක් ගෙවීමට එකඟ වී තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට එම කටයුතු සඳහා රුපියල් මිලියන 19.6ක් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණි. ඒ අනුව එකම සේවාව සැපයීම සඳහා දෙපාර්ශවයකට ගෙවීම් කර තිබුණි. | | |
| (ආ) | 2022 අප්‍රේල් මාසයේදී JICA ණය ලබා දීම නතර කර ඇති බව දැනගත් පසුවත් ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති පැකේජ 04ක් සඳහා 2022 මැයි මාසයේදී කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. අරමුදල් ලබාදීම නවතා ඇති තත්ත්වයකදී සිදුකරමින් පවතින සිවිල් වැඩ සඳහා මුදල් ගෙවා වැඩ නිම කිරීමට හැකියාව තිබියදී ඊට ප්‍රමුඛත්වය ලබා නොදී අලුතින් පිරිනැමූ ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග කොන්ත්‍රාත් පැකේජ 03ක් සඳහා ස්ථානගතවීමේ අත්තිකාරම් ලෙස රුපියල් මිලියන 37ක් ගෙවා තිබුණි. | මෙම කොන්ත්‍රාත් පැකේජ සඳහා ස්ථානගතවීමේ අත්තිකාරම් ගෙවා නොතිබූ අතර පිළිගැනීමේ ලිපි පමණක් යවා තිබුණි. | ගෙවීම් සිදු කර දැනට කෙරෙමින් පවතින සිවිල් වැඩ අවසන් කිරීමට කටයුතු කළ යුතු අතර විගණනයට නිවැරදි පිළිතුරක් ලබා දිය යුතුය. |

**2.3** මානව සම්පත් කළමනාකරණයට අදාල ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියට කළමනාකරණ සහකාරවරයෙකු ලෙස බඳවා ගන්නා ලද නිලධාරියෙකු 2017 පත්වීම් දින සිට අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ව්‍යාපෘති) වෙත පෞද්ගලික සහකාර ලෙස අනුයුක්ත කර තිබේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඉහත සඳහන් කළමනාකාරණ සහකාර වෙත එකතුව රු.මිලියන 1.5ක් ගෙවා තිබුණි. | JICA ව්‍යාපෘතිය සම්බන්ධ අත්දැකීම් සහිත අමාත්‍යාංශයේ සේවය කරන නිලධාරියෙකු කළමනාකාර සහකරුවකු ලෙස ව්‍යාපෘතියට අනුයුක්ත කර ඇත. | පත්කිරීම අවසන් කිරීමට ව්‍යාපෘතිය පියවර ගත යුතුය. |

**2.4** පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති සංදේශයේ ඇමුණුම 16 හි සඳහන් උප ව්‍යාපෘති සඳහා අපේක්ෂිත මූල්‍ය හා භෞතික ඉලක්ක ඇතුළත් කිරීමට සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මේ අදාළ පිටුවේ පිටපතක් ඉදිරිපත් කර ඇත. | ව්‍යාපෘති සංදේශයේ ඇමුණුම 16 හි සඳහන් පරිදි උප ව්‍යාපෘති සඳහා අපේක්ෂිත මූල්‍ය හා භෞතික ඉලක්ක ඇතුළත්ව සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් ව්‍යාපෘතිය විසින් සකස් කළ යුතුය. |